# ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

**නිකුතුව : මැයි 2020** **මාර්ගෝපදේශ අංක: 02/2020**

## තේ වගාවන් හි කොවිඩ් -19 පැතිරීම වැළැක්වීම සහ පාලනය කිරීම පිළිබඳ මාර්ගෝපදේශය

පොදුවේ කොවිඩ්-19 ලෙස හැඳින්වෙන කොරෝනා වෛරසය නිසා ඇතිවූ වසංගත තත්වයෙන් මුළු ලොවම පීඩාවට පත්ව ඇත. ශ්‍රී ලංකාව ද මේ වන විට කොවිඩ්-19 තර්ජනයට ලක්ව සිටී. ගෝලීය වශයෙන්, කොවිඩ් -19 වසංගතය ආර්ථිකයට සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇති අතර ඉහළ මධ්‍යම ආදායම් ලබන රටක් ලෙස ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙරෙහිද අහිතකර ලෙස බලපා ඇත. මෙය නිසැකවම සෞඛ්‍ය, සමාජීය හා ආර්ථික ක්ෂේත්‍රයන්හි කෙටි, මධ්‍යම හා දිගු කාලීනව අහිතකර බලපෑම් ඇති කරනු ඇත.

කොවිඩ්-19 යනු ශ්වසන රෝගයක් වන අතර එය සම්ප්‍රේෂණය වන්නේ පහත සඳහන් ආකාර 3 මගිනි.

1. බිඳිති ලෙස - ආසාදිත බිඳිති ආශ්වාස කිරීමේදී වෛරසය සම්ප්‍රේෂණය වේ. ආසාදිත පුද්ගලයින්ගේ කැස්ස, කිවිසීම් හෝ ප්‍රාශ්වාස කිරීමේදී මෙම බිඳිති නිපදවිය හැකිය. මෙම බිඳිති වලට මීටරයක පමණ දුරක් ගමන් කිරීමේ හැකියාව ඇත.

2. සෘජුවම - ආසාදිත පුද්ගලයෙකු සමඟ සෘජු සම්බන්ධතා පැවැත්වීම මගින් පුද්ගලයාගෙන් පුද්ගලයාට වෛරසය සම්ප්‍රේෂණය වේ (උදා: වැළඳ ගැනීම, අතට අත දීම වැනි). වෛරසය ශරීරයට ඇතුල් වන්නේ නාසයෙන්, මුහුණෙන් හෝ ඇස් තුලිනි.

3. වක්‍රාකාරයෙන් - ආසාදිත පුද්ගලයෙකු කහින විට, කිවිසීමේදී හෝ ප්‍රාශ්වාස කිරීමේදී මුදාහැරෙන ආසාදිත දියර බිඳිති බංකු, මේස, දුරකතන හා පරිගණක වැනි වස්තූන් මත පතිත වේ. ආසාදනය නොවූ පුද්ගලයෙකු මෙවැනි පෘෂ්ඨ ස්පර්ශ කර ඔහුගේ ඇස, නාසය හෝ මුහුණය ස්පර්ශ කලේ නම් එමගින් මෙම වෛරසය සම්ප්‍රේෂණය වේ.

එනිසා මෙහි විස්තර වන ආකාරයට තම සේවා ස්ථාන වල, මෙලෙස වෛරසය සම්ප්‍රේෂණය වීම වළක්වා ගැනීම සඳහා වඩාත් උචිත ක්‍රම අනුගමනය කල යුතුයි. මෙම වෛරසය සම්ප්‍රේෂණය වීම වළක්වා ගැනීම සඳහා පුද්ගල හැසිරීම ද ඉතා වැදගත් වේ.

මුහුණු ආවරණ පැළඳීම සහ මුහුණ ස්පර්ශ නොකිරීම යන සරල ක්‍රියාමාර්ග දෙක අනුගමනය කිරීමෙන් ඕනෑම පුද්ගලයෙකුට මෙම වෛරසය ආසාදනය වීමෙන් ආරක්ෂා විය හැකිය.

පවත්නා මෙම තත්වය තුල කොවිඩ්-19 ආසාදනයෙන් ආරක්ෂා වීම සඳහා සේවා ස්ථාන වල මෙහෙයුම් ක්‍රියාවලිය සහ සේවා පරිසරය වෙනස් කල යුතුය. එබැවින් තේ කර්මාන්තයේ පාර්ශවකරුවන්ට තේ ක්ෂේත්‍රයේ, කර්මාන්තශාලාවේ සහ කාර්යාලයේ වැනි තම සේවා ස්ථානවල, වරින් වර නිකුත් කරන ලද රාජ්‍ය සහ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ මාර්ගෝපදේශයන්ට අනුකූලව පහත සඳහන් මාර්ගෝපදේශ අනුගමනය කරන ලෙස මෙයින් උපදෙස් දෙනු ලැබේ.

පහත සඳහන් කාණ්ඩවල කාර්ය මණ්ඩලය සහ කම්කරුවන් වැඩ සඳහා වාර්තා නොකළ යුතුය.

1. කැස්ස, සෙම්ප්‍රතිශ්‍යාව, උගුරේ වේදනාව වැනි ශ්වසන අපහසුතා ලක්ෂණ සහිතව හෝ රහිතව උණ ඇති අය.
2. පසුගිය දින 14 තුළ කොවිඩ්-19 වැළඳී ඇති බව තහවුරු කල හෝ සැක සහිත අය සමඟ සම්බන්ධකම් පැවැත්වූ අය.
3. කොවිඩ්-19 සඳහා නිරෝධායනය කර ඇති අය.
4. කොවිඩ්-19 සැක සහිත සිද්ධීන් සඳහා ස්වයං නිරෝධායන ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද පරිශ්‍ර සහ / හෝ නිවාස යෝජනා ක්‍රමවල සිටින අය.

රැකියා ස්ථානවල විශාල පිරිසක් නිතර රැස්ව සිටින අතර, සේවා ස්ථාන ආරක්ෂිතව හා සෞඛ්‍ය සම්පන්නව තබා ගැනීම සියළුම දෙනාගේ සාමූහික වගකීමකි. මෙම මාර්ගෝපදේශය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන වගකීම පැවරී ඇත්තේ එක් එක් ආයතනයේ කළමනාකරණය මත ය.

කොවිඩ්-19 ආසාදනය සම්ප්‍රේෂණය වීම වැළැක්වීම සඳහා සියලුම කාර්ය මණ්ඩල සහ සේවකයින් පහත සඳහන් නිර්දේශයන් පිළිපැදිය යුතුය.

**පොදු කරුණු:**

1. කොවිඩ්-19 ආසාදනය පාලනය සඳහා ක්‍රියාත්මක ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ කළමනාකරණය සඳහා සුදුසු කේන්ද්‍රීය පුද්ගලයෙකු (වගකිවයුතු නිලධාරියෙකු) තෝරාගෙන ඔහුට අවශ්‍ය මඟපෙන්වීම සපයන්න.

2. සෑම වතුයායකම ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය, ක්ෂේත්‍ර නිලධාරීන්, කර්මාන්තශාලා නිලධාරී, වතු වෛද්‍ය සහකාර (EMA), සුභසාධන නිලධාරී, නිරාපද නිලධාරියා හෝ නිලධාරීන් සහ වතු ප්‍රජාව නියෝජනය කරන්නන් ඇතුලත් වන පරිදි කාර්ය සාධක බලකායක් පිහිටුවන්න.

3. එක් එක් වතුයාය තුල නිසි සම්බන්ධීකරණය, තොරතුරු ගලායාම සහ තීරණ ගැනීම යනාදිය හොඳින් සිදුවන බවට සහතික කර ගැනීම සඳහා වතු ප්‍රජාව තුළ සුපරීක්ෂාකාරී කමිටු පත් කරන්න.

4. කොවිඩ්-19 පැතිරීම පිළිබඳ දැනුවත් කිරීම් දිගින් දිගටම සිදු කිරීම සහ නිවාස හා ලයින් කාමරවල රැඳී සිටීමට දිරිගන්වන්න.

5. සියළුම නේවාසික පුද්ගලයින්, අමුත්තන්, වෙනත් ප්‍රදේශවලින් සහ පිටරටවලින් පැමිණෙන පිරිස්, ප්‍රතිශක්තිය අඩු හා දියවැඩියාව, හෘද රෝග, වකුගඩු, අක්මා, ඇදුම සහ පෙනහළු රෝග වලින් පෙළෙන කම්කරුවන්, වයස අවුරුදු 40 ට වැඩි පුද්ගලයින් පිළිබඳ සංගණනයන් ගැනීම සහ නිසි පරිදි වාර්තා තබා ගන්න.

6. සේවකයින් සහ කාර්ය මණ්ඩල සාමාජිකයින් සමග වාචික සන්නිවේදනය අවම කිරීම සහ ඔවුන් සමග සන්නිවේදනය කිරීම සඳහා විකල්ප ක්‍රම (මහජන ඇමතුම් පද්ධති, ඉන්ටර්කොම් ආදිය) භාවිතා කිරීම සඳහා නිලධාරීන්ට උපදෙස් ලබා දෙන්න.

7. අනිකුත් සේවකයින්ගේ දළු කූඩ, ගෝනි, පිහි, ජංගම දුරකථන, පෑන් සහ පොදු දුරකථන, මේස සහ වෙනත් උපකරණ ආදිය පරිහරණය කිරීම අධෛර්යමත් කරන්න. කිසියම් උපකරණයක් හුවමාරු කරගෙන තිබේ නම් එය සබන් හා ජලය හෝ අවම වශයෙන් 70% v/v ක මධ්‍යසාර පදනම් කරගත් සනීපාරක්ෂක දියරයක් භාවිතා කර පිරිසිදු කරගන්න.

8. කාර්යක්ෂමව අධීක්ෂණය, අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සහ කළමනාකරණ ක්‍රමවේදය වඩාත් විධිමත් කිරීම සඳහා නිරන්තර සමාලෝචනයන් සිදු කරන්න.

9. වැඩපොලෙහි දී යම් සැක සහිත රෝගියෙකු හමුවුව හොත් වහාම 1390 ක්ෂණික දුරකතනය අමතා එමගින් ලබාදෙන උපදෙස් නිසියාකාරව පිළිපදින්න. එසේ නැතහොත් ගිලන් රථයක් මගින් රෝගියා ළඟම ඇති රෝහල වෙත යවන්න. 1990 ක්ෂණික දුරකථනයෙන් අමතා සුවසැරිය ගිලන් රථ සේවයේ සහය ද ලබා ගැනීමට පුළුවන.

10. අඩු අවදානමක් ඇති කම්කරුවන් වැඩ සඳහා යෙදවන්න. ප්‍රතිශක්තිය අඩු සහ දියවැඩියාව, හෘද රෝග, වකුගඩු, අක්මා, ඇදුම සහ පෙනහළු රෝග වලින් පෙළෙන පුද්ගලයින්, වයස අවුරුදු 40 ට වැඩි අය අවදානම් සහිත පුද්ගලයින් ය.

**ක්ෂේත්‍රයේ දී**

1. තේ ඉඩමේ දළු නෙලීම, වල්පැල පාලනය, පොහොර යෙදීම, කප්පාදු කිරීම සහ තවාන් නඩත්තු කිරීම වැනි අත්‍යවශ්‍ය ම කෘෂිකාර්මික කටයුතු වලට පමණක් සීමා වන්න. එසේ වුවද, මෝසම් වර්ෂා කාලය පැමිණෙන විට සෙවන ගස් කළමනාකරණය, බුබුළු අංගමාරය පාලනය සඳහා ද කටයුතු කලයුතුය.

2. පෙරට්ටුවෙ හි, දළුකිරන ස්ථානයන් හි, තේ පානය කරන ස්ථානයන් හි වැඩ කරනවිට මෙන් ම සේවකයන් ප්‍රවාහණයේ දී ද, සේවකයන් අතර අවම වශයෙන් මීටරයක පරතරයක් තබා ගනිමින් වැඩ කටයුතු කරන්න.

3. සැමවිටම අවම වශයෙන් මීටරයක දුර ප්‍රමාණයක් පවතින ආකාරයට තේ පේළි වෙන් කර දළු නෙලීම සඳහා ලබා දෙන්න.

4. සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීම සහ අඛණ්ඩව නිරාවරණය වීම වළක්වා ගැනීම සඳහා කම්කරුවන් මාරුවෙන් මාරුවට ක්ෂේත්‍ර වැඩ සඳහා යොදවන්න.

5. සියළුම කාර්ය මණ්ඩලය සහ සේවකයින් විසින් සුදුසු මුහුණු ආවරණ සහ අත්‍යවශ්‍ය අවස්ථාවන් හිදී පමණක් අත්වැසුම් නිසි ලෙස පැලඳ සිටීම අනිවාර්ය කරන්න.

6. සුදුසු මද්‍යසාරමය සනීපාරක්ෂක දියර මිශ්‍රණයක්/සබන් සහ දෑත් පිරිසුදු කර ගත හැකි ස්ථානයක් ලබා දීම මගින් සෑම තීරණාත්මක අවස්ථාවකම කම්කරුවන්ගේ සනීපාරක්ෂාව ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරන්න.

7. ක්ෂේත්‍ර උපකරණ, ආහාර ද්‍රව්‍ය, තේ, බුලත් විට, දුම් පානයන් මෙන් ම මුහුණු ආවරණ, තේ දළු කූඩ, මට්ටම් ලී ආදි වෙනත් භාණ්ඩ ද හුවමාරු කරගැනීම අධෛර්යමත් කරන්න.

8. සියලු දෙනා එක් ස්ථානයක රැස්වී තේ පානය කිරීම වැළැක්වීම සඳහා කණ්ඩායම් කීපයක් ලෙසට ස්ථාන කීපයකදී තේ පානය කිරීම සඳහා නිදහස් කරන්න.

9. සේවකයින් යොදා ගැනීම අවම කිරීම සඳහා "තේ පර්යේෂණායතන තෝර දළු නෙලනය", දළු නෙලීමේ යන්ත්‍ර සහ කප්පාදු යන්ත්‍ර භාවිතය දිරිමත් කරන්න.

10. සියළුම ක්ෂේත්‍ර උපකරණ, යන්ත්‍රෝපකරණ, නිල ඇඳුම්, වාහන සහ අනෙකුත් පුද්ගලික දෑ විෂබීජහරණය සඳහා කටයුතු කරන්න.

**කර්මාන්ත ශාලාවේ දී**

1. එකම පුද්ගලයින් නිරන්තරයෙන් ස්පර්ශ වීම අවම කිරීම සඳහා සේවාමුර ක්‍රමයට වැඩෙ හි යොදවන්න.

2. සෑම විටම අවම වශයෙන් මීටර් එකක සමාජ දුරස්ථභාවය පවත්වා ගන්න.

3. පිරිසිදු වීමට ස්ථානයක් සහ සුදුසු විෂබීජ නාශකයක් සැපයීම, කහිනවිට අනුගමනය කරන චාර්ත්‍ර විධි අනුගමනය සහ මුහුණු ආවරණ පැලදීම දිරිමත් කිරීම මඟින්, සියලු තීරණාත්මක අවස්ථාවන් හි දෑත් පිරිසිදුව තබා ගැනීමට පුරුදු කරන්න.

4. කිරුම් ස්ථානයන්හි, බඩු පැටවීමේ දී සහ බඩුබෑමේ දී සහ තේ පානය කිරීම වැනි අවස්ථාවන්හි දී සේවකයන් එක් රැස්වීම වලක්වන්න.

5. තේ සැකසුම් ප්‍රදේශයේ ප්‍රමාණවත් තරම් වාතාශ්‍රය ලබා දීමට කටයුතු කරන්න.

6. සේවකයන් එක් ස්ථානයක සිට වෙනත් ස්ථානයන්ට සංචරණය හැකිතරම් දුරට අවම කරන්න.

7. ආහාර, බුලත්විට, ආදිය සහ පොදු උපකරණ හුවමාරු කර ගැනීම අධෛර්යමත් කරන්න.

8. සේවක සහභාගීත්වය අවම කිරීම සඳහා පියවර ගන්න.

9. එක දිගට වැඩකර දවසේ වැඩ නිම කිරීම දිරිගන්වන්න.

10. තේ විවේකය කණ්ඩායම් වශයෙන් හෝ එක් එක් අංශය සඳහා වෙන වෙනම ලබා දෙන්න.

11. සියළුම උපකරණ, යන්ත්‍රෝපකරණ, නිල ඇඳුම්, වාහන සහ අනෙකුත් පුද්ගලික දෑ විෂබීජහරණය සඳහා කටයුතු කරන්න.

12. දොර හැඩල, අත්වැට, වැසිකිලි ආදිය නිතිපතා පිරිසුදු කර විෂබීජහරණය කරන්න.

13. අමු දලු, ඉවතලන තේ, ඉන්ධන දැව ආදීය, ප්‍රවාහනය කරන පුද්ගලයින් දෑත් පිරිසිදුව තබා ගැනීම, කහිනවිට සිදුකලයුතු සමාජ චාරිත්‍ර විධි අනුගමනය සහ මුහුණු ආවරණ පැළදීම පිළිබඳ සැලකිලිමත් වන්න. ප්‍රවාහනය සඳහා භාවිතා කරන බාහිර වාහන සංඛ්‍යාව සීමා කරන්න.

14. ලොරි රියදුරුට සහ සහායකයාට පුද්ගලික සනීපාරක්ෂාව පිළිබඳ උපදෙස් දීමෙන්, ප්‍රවාහනයේදි නිරතුරුව පරිහරණය කිරීම සඳහා විෂබීජ නාශක දියර, මුහුණු ආවරණ සැපයීමෙන්, ලොරි මගින් කොළඹට තේ ප්‍රවාහනයේ දී අතිශයින්ම පූර්වාරක්ෂාවන් අනුගමණය කරන්න.

15. තේ ප්‍රවාහනය, හැසිරවීම, වෙන්දේසි කිරීම, පරීක්ෂා කිරීම සඳහා නියැදි ගැනීම, සැකසීම, ඇසුරුම් කිරීම සහ නැව්ගත කිරීම සඳහා ගබඩා කිරීම ආදියෙ හි දී විනිවිදභාවය රැකෙන පරිදි වාර්තා සහිතව කටයුතු කිරීම මගින් අපේක්ෂිත ආහාර සනීපාරක්ෂක ප්‍රමිතීන් පිළිබඳ මාර්ගෝපදේශයන්ට අනුකූල වන්න.

**වතු කාර්යාල පරිශ්‍රයේ දී**

1. කාර්යාලයට ඇතුල් වන ස්ථානයේ අත් සේදීම සඳහා පහසුකම් සලසා දී අත් සනීපාරක්ෂාව පිළිබඳ සහතික වීම සහ නිතිපතා අත් සේදීම ප්‍රවර්ධනය කරන්න. කඩින විට අනුගමනය කල යුතු ආචාර විදි අනුගමනය කිරීම සහ මුහුණු ආවරණ පැළඳ කාර්යාලයට ඇතුල් වීම තහවුරු කරන්න.

2. රැකියා ස්ථානයේ සමාජ දුරස්ථභාවය සහතික වන අයුරින් කාර්යාලය නැවත සකස් කිරීම. පිටස්තර පුද්ගලයින් හා සෘජු සම්බන්ධතා වළක්වා ගැනීම සහ මුදල් අයකැමි කවුන්ටරය සඳහා බාධකයක් ස්ථාපිත කරන්න.

3. සේවා ස්ථානයේ සිටින මුළු සේවක සංඛ්‍යාව අඩු කිරීම සඳහා විකල්ප දින සහ / හෝ අමතර සේවා මුර ඇති කරන්න.

4. අභ්‍යන්තර හා බාහිර පුද්ගලයින් සමඟ අනවශ්‍ය රැස්වීම් සහ එකතුවීම් වලින් වළකින්න. කෑම කාමරවල සේවකයින් අනවශ්‍ය ලෙස රැස්වීම වැළැක්වීම සඳහා තේ සහ දිවා ආහාර විවේක කණ්ඩායම් ලෙස ලබා දෙන්න.

5. මතුපිට පෘෂ්ඨ, කාර්යාල උපකරණ, දොර හැඬල සහ වැසිකිළි ආදිය විෂබීජ හරණය කිරීම සහ නිතිපතා පිරිසිදු කිරීමේ කටයුතු සිදු කරන්න.

6. අපද්‍රව්‍ය කළමනාකරණය හා කසළ බැහැර කිරීම, පිරිසිදු කිරීම සහ විෂබීජ හරණ කටයුතු සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කරන්න.

7. කාර්ය මණ්ඩලය විසින් මේස, වැඩකරන ස්ථාන, පොදු දුරකථන, ෆැක්ස් යන්ත්‍ර, පෑන්, කැල්කියුලේටර, ආහාර, තේ, බුලත් විට ආදිය හුවමාරු කරගැනීම අධෛර්යමත් කරන්න.

8. වාතාශ්‍රය වැඩි දියුණු කිරීම සහ නිතිපතා පරිහරණය (අතින් ඇල්ලීම) වළක්වා ගැනීම සඳහා දොරවල් සහ ජනෙල් විවෘතව තබන්න.

9. අනෙකුත් සේවකයින් සමග වාචික හා ලිඛිත සන්නිවේදනය අවම කිරීමට සහ අභ්‍යන්තර සන්නිවේදනය සඳහා විකල්ප ක්‍රම (මහජන ඇමතුම් පද්ධති, ඉන්ටර්කොම් ආදිය) භාවිතය ප්‍රවර්ධනය කිරීමට කාර්ය මණ්ඩලයට උපදෙස් දෙන්න.

10. මුදල් පරිහරණය අවම කිරීම, ආහාර ද්‍රව්‍ය බෙදා හැරීම විධිමත් කිරීම සහ පුද්ගලයින් අතර භෞතික ගැටීම් වළක්වා ගැනීම ආදිය සඳහා විකල්ප ක්‍රම හඳුන්වා දෙන්න.

**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය**
**තලවාකැලේ**

*අයිතිය*

*සියලුම හිමිකම් ඇවිරිණි. මෙම ප්‍රකාශනයේ කිසිදු කොටසක් ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ අධ්‍යක්ෂකගේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව ඡායා පිටපත් කිරීම, පටිගත කිරීම, ස්කෑන් කිරීම හෝ තොරතුරු ගබඩා කිරීම සහ නැවත ලබා ගැනීමේ පද්ධති ඇතුළුව විද්‍යුත් හෝ යාන්ත්‍රික ක්‍රම මගින් පිටපත් කිරීම, ප්‍රති නිර්මාණය කිරීම හෝ සම්ප්‍රේෂණය කළ නොහැක.*